**රාජගිරිය, පොල්ගහවෙල සහ ගනේමුල්ල ගුවන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2018**

---

රාජගිරිය, පොල්ගහවෙල සහ ගනේමුල්ල ගුවන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ස්පාඤ්ඤ රජයේ බැන්කෝ බිලබාවෝ විස්කායා ආ(ර්)ජන්ටාරියා අතර 2015 දෙසැම්බර් 14 දින එළඹි අංක එස්එල්ආර් - 14809 දරන ණය ගිවිසුමේ 01 ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග, වරාය සහ නාවික අමාත්‍යාංශය, වර්තමානයේ මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. රටේ සමාජ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම, වාහන තදබදය ආශ්‍රිතව පවතින ආර්ථික සහ සමාජ පිරිවැය ඉතිරිකිරීම සහ සුමට සංචලතා පහසුකම් සැපයීම සඳහා රාජගිරිය, පොල්ගහවෙල සහ ගනේමුල්ල ගුවන් පාලම් සැලසුම් කිරීම, සැපයීම සහ ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වටිනාකම රු.මිලියන 9,762 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 55.78 ක් වූ අතර ඉන් රු.මිලියන 8,862 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 50.64 ක් ස්පාඤ්ඤ රජයේ බැන්කෝ බිලබාවෝ විස්කායා ආ(ර්)ජන්ටාරියා විසින් ලබා දීමට එකඟ වී තිබුණි. ඉතිරි රු. මිලියන 900 ක වටිනාකම ශ්‍රී ලංකා රජය මඟින් අරමුදල් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 අප්‍රේල් 19 දින ආරම්භ කරන ලද අතර 2018 දෙසැම්බර් 31 දින නිම කිරීමට නියමිතය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කටයුතු නිමවන දිනය 2020 ජුනි 30 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය.

2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණන කාලය තුළදී හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලනයේ වැදගත් අකාර්යක්ෂමතා ඇතුළුව අනෙකුත් කරුණු අතරින් වැදගත් විගණන සොයාගැනීම්, සම්බන්ධ පාර්ශවයන් සමඟ සන්නිවේදනය කරනු ලැබේ.

## 2. භෞතික කාර්යසාධනය.

### 2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය.

පොල්ගහවෙල, රාජගිරිය සහ ගනේමුල්ල ගුවන් පාලම් සැලසුම් කිරීම, සැපයීම සහ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව යුරෝ මිලියන 53.71 ක ඇස්තමේන්තුගත පිරිවැයට පිරිවැටුම් පදනම මත විදේශීය ඉදිකරීම් සමාගමකට පවරා තිබුණි. අදාළ ඉදිකිරීම් කටයුතු 2016 අප්‍රේල් 19 දින ආරම්භ කරන ලද අතර මාස 32 ක් තුළදී නිම කිරීමට සැලසුම් කර තිබුණි. ගුවන් පාලම් නිමකිරීමට නියමිත දිනට මාස 11 කට පෙර, 2018 ජනවාරි මස ගමනාගමනය සඳහා විවෘත කරන ලදී. ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන වාර්තාව අනුව රාජගිරිය ගුවන් පාලම ඉදිකිරීම මඟින් අපේක්ෂිත ආර්ථික අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය සියයට 47.50, පිරිවැය ප්‍රතිලාභ අනුපාතය සියයට 14.98 සහ ශුද්ධ වර්තමාන අගය රු.මිලයන 17,737 ක් අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු විසින් පිළියෙල කරන ලද

පශ්චාත් බලපෑම් ඇගයීම් වාර්තාව අනුව ගුවන් පාලම් වැඩ ඉදිකිරීම් සම්පූර්ණ වන අවස්ථාව වන විට ආර්ථික අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය සියයට 43.30, පිරිවැය ප්‍රතිලාභ අනුපාතය සියයට 8 ක් සහ ශුද්ධ වාර්තමාන අගය රු.මිලියන 10,163 ක් පමණක් ළඟා කරගෙන තිබුණි. එබැවින් ගුවන් පාලම ඉදිකිරීමේ සමාජ ප්‍රතිලාභ සම්බන්ධ ඉදිරි දර්ශන ඉදිකිරීම් වැඩ අවසන් වූ පසු කැපී පෙනෙන ලෙස පහත වැටී තිබුණු බව අනාවරණය විය.

## 2.2 කොන්ත්‍රාත් පරිපාලනය.

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| පොල්ගහාවෙල දුම්රිය විවේකාගාරය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු මූලික අදියරේදී කොන්ත්‍රාත්තුවේ කොටසක් ලෙස හඳුනානොගෙන වෙනම කොන්ත්‍රාත්කුවන් ලෙස ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 23.40 කට වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමා තිබුණු බව නිරීක්ෂණය විය. | ශ්‍රී ලංකා රජය අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. | අදහස් ලැබී නොතිබුණි. | ඉටු කිරීමට අපේක්ෂිත වැඩ සම්බන්ධයෙන් පූර්ව සමීක්ෂණයක් සිදු කිරීමට සහ අනපේක්ෂිත අතිරේක පිරිවැය මඟහැරවා ගැනීමට අවධානය යොමුකළ යුතුය. |

## 2.3 මතභේදයට තුඩු දුන් කරුණු.

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| ව්‍යාපෘතියේ කටයුතු 2018 ජනවාරි මස සම්පූර්ණ කර තිබුණද, ව්‍යාපෘතියේ වත්කම් සහ වගකීම් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පැවරීමේ ප්‍රමාදය නිසා සහ ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමේ ප්‍රමාදය නිසා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කටයුතු 2018 දෙසැම්බර් 31 දින දක්වා අඛණ්ඩව පවත්වා ගෙන ගොස් තිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම සඳහා කාලය දීර්ඝ කිරීමේ හැකියාව පවති. | අදහස් ලැබී නොතිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කටයුතු කිරීම අවශ්‍ය වේ. |